**ලංකා ලේඛක සංවිධානය**
**இலங்கை எழுத்தாளர் அமைப்பு**
**Writers Organization of Lanka**

12-11-2022

**ලංකා ලේඛක සංවිධානයෙන් නිකුත් කෙරෙන මාධ්‍ය නිවේදනයයි.**

**සංස්කෘතික නිලධාරි තනතුරු අහෝසි කිරීම සම්බන්ධවයි.**

දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින සංස්කෘතික නිලධාරීන් සියලු දෙනා ඒකාබද්ධ සේවාවට යොමු කිරීමට රජය තීරණය කර ඇති බව දැනගන්නට ලැබී තිබේ.

මෙම තීරණය හේතුවෙන් වස ගණනාවක් මුළුල්ලේ ප්‍රාදේශීය මට්ටමින් සිදු වූ කලා සාහිත්‍ය ඇතුළු සියලු සංස්කෘතික ක්‍රියාකාරකම් වලට බරපතළ හානියක් සිදු වනු ඇත. 1956 දී ඇරඹි සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූලික අරමුණක් වූයේ රාජ්‍ය අනුග්‍රහය මගින් රටේ සමස්ත ජනතාවටම උසස් සංස්කෘතික ජීවිතයක් ගත කිරීමට අවැසි පහසුකම් සලසා දීමය. මෙම සංස්කාතික නිලධාරින් හරහා සිදු වූයේ එම ක්‍රියාවලියයි. එය හිතුමතේ අහෝසි කර දැමීම මහජන බදු වලින් සංස්කෘතිය නගා සිටුවීමට වෙන් කර ඇති ප්‍රතිපාදන කප්පාදු කිරීමකි. සංස්කෘතිය පෝෂණය කිරීමට රජයකට ඇති වගකීම පැහැර හැරීමකි.

මෙම අමනෝඥ තීරණය දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකින ලංකා ලේඛක සංවිධානය එය වහා ඉවත් කරගන්නා ලෙසද රජයට බල කර සිටී.


කමල් පෙරේරා
ලේකම් - 077 3655151 / 071 8670913

අනුරසිරි හෙට්ටිගේ
සභාපති -071 5316568


පිටපත්- සංස්කෘතික රාජ්‍ය අමාත්‍යාංශය

සංස්කෘතික නිලධාරීන්ගේ සංගමය

ජනමාධ්‍ය ආයතන